# අධ්‍යාපන අමාත්‍යාංශය

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

## ළමා සහ යොවුන් සාහිත්‍ය ග්‍රන්ථ අත්පිටපත් මුද්‍රණාධාර ව්‍යාපෘතිය

**2021-2022**


ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

අංක 14, නිදහස් මාවත

කොළඹ 07

2022 වර්ෂය සඳහා අත්පිටපත් 2021 ඔක්. 26 දින සිට 2022 ජන.31 දින දක්වා (රජයේ නිවාඩු දින හැර) පෙ.ව.9.00 - ප.ව. 3.00 කාලය තුළ භාර ගනු ලැබේ.

**අයදුම්පත්‍ර** - අයදුම්පත්‍රය හා විස්තර පත්‍රිකාව රු.150.00 ගෙවීමෙන් ලබා ගත හැකිය.

**ලිපි හා විමසීම්** -

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත
කොළඹ 07
දුරකථන අංක : 011 2687583
011 3610773
011 2698847 දිගුව 261 හෝ 248
ෆැක්ස් : 011 2687583
විද්‍යුත් තැපැල : pub@mail.natlib.lk

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

## ළමා සහ යොවුන් සාහිත්‍ය ග්‍රන්ථ අත්පිටපත් මුද්‍රණාධාර ව්‍යාපෘතිය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මෙහෙයවන ළමා සහ යොවුන් සාහිත්‍ය ග්‍රන්ථ අත්පිටපත් මුද්‍රණාධාර ව්‍යාපෘතිය, පහත සඳහන් අරමුණු සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි.

### 1. අරමුණු

(අ) දරුවන්ගේ කියවීම ප්‍රවර්ධනය කිරීම
(ආ) ගුණාත්මක බවින් යුත් ළමා හා යොවුන් සාහිත්‍ය ග්‍රන්ථ සුලභ කිරීම
(ඇ) ගුණාත්මක කෘති ඉදිරිපත් කරන කර්තෘවරු මෙන්ම පරිවර්තකයින් දිරිමත් කිරීම
(ඈ) පාසල් ළමයින්ගේ අතිරේක කියවීම් වැඩිදියුණු කිරීම.

### 2. ඉදිරිපත් කළ හැකි අත්පිටපත්

වයස අවුරුදු 06 – 16 දක්වා වයස් කාණ්ඩවල දරුවන් සඳහා ලියැවුණු ළමා අත්පිටපත් සහ යොවුන් සාහිත්‍ය වෙනුවෙන් ලියැවුණු අත්පිටපත් මේ සඳහා ඉදිරිපත් කළ හැකි වේ.

(අ) මීට පෙර මුද්‍රණයෙන් ප්‍රකාශ නොවූ කෘති

(ආ) යුනෙස්කෝ නිර්නායක අනුව ළමා ග්‍රන්ථයක් සඳහා මුද්‍රණය කළ පසු පිටු 16 ක් හෝ ඊට වැඩි කෘති, යොවුන් සාහිත්‍ය කෘතියක් නම් පිටු 49 ක් හෝ ඊට වැඩි පිටුගණනක් සහිත කෘති

(ඇ) ගද්‍ය, පද්‍ය, ගීත, නාට්‍ය වැනි නිර්මාණාත්මක කෘති හා එවැනි පරිවර්තිත අත්පිටපත් මේ සඳහා ඉදිරිපත් කළ හැකිය.

### 3. ඉදිරිපත් කළ නොහැකි අත්පිටපත්

(අ) විෂය මූලික පොතපත/ප්‍රශ්නෝත්තර/විභාග ඉලක්ක කොට ලියූ පොත් මීට අදාළ නොවේ.

(ආ) වෙනත් ආධාර ව්‍යාපෘතියක් යටතේ ආධාර ලැබූ අත්පිටපත්

(ඇ) ළමා ලේඛකයින්ගේ අත්පිටපත්

### 4. ආධාර පටිපාටිය

මුද්‍රණ අනුග්‍රහය ලැබීමට අනුමත අත්පිටපත් සඳහා උසස් මුද්‍රණ ප්‍රමිති හඳුන්වාදීම සහ ඒ අනුව, මුද්‍රණය කළ පසු එයින් පිටපත් ප්‍රමාණයක් මිල දී ගැනීම මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් ලේඛකයාට ආධාර කරයි. මෙසේ ඉදිරිපත් කරනු ලබන අත්පිටපත් සඳහා ලබාදෙන ආධාර මුදලේ උපරිමය ළමා ග්‍රන්ථ සඳහා රු.40,000/= ද, යොවුන් සාහිත්‍ය සඳහා රු.50,000 ක් ද වේ.

**සැ.යු : ආධාර අනුමත වූ කෘතියකින් අවම වශයෙන් පිටපත් 1000 ක් ප්‍රකාශයට පත් කළ යුතුය. මණ්ඩලයීය මුද්‍රණ උපදේශක කමිටුව මඟින් තීරණය කරනු ලබන මුදලට සරිලන පිටපත් සංඛ්‍යාවක් මිල දී ගැනීමෙන් මණ්ඩලය ලේඛකයාට ආධාර කරනු ඇත.**

### 5. අත්පිටපත් සකස් කිරීම

(අ) අත්පිටපත් තනි පිටුවේ පැහැදිලිවත්, නිවැරදිවත් පරිගණක අක්ෂර සංයෝජනය හෝ යතුරු ලියනය කොට ඉදිරිපත් කළ යුතුය. කෘතිය සඳහා අදාළ වන චිත්‍ර, ඡයාරූප, රූපසටහන් ආදිය ද ඇතුළත් විය යුතුය.(පිටු 16 ක් සඳහා අවම වශයෙන් චිත්‍ර 5 ක් වත් ඇතුලත් විය යුතුය.)

(ආ) සමීක්ෂකවරයාට සිය නිරීක්ෂණ පහසුවෙන් සටහන් කළ හැකි වන ආකාරයට කොළයේ වම් කෙළවරේ සහ පේළි අතර සැලකිය යුතු ඉඩ ප්‍රමාණයක් තිබිය යුතුය.

(ඇ) මුද්‍රිත කෘතියට ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන චිත්‍ර, ඡායාරූප, පටුන ආදිය අත්පිටපත සමඟ ඉදිරිපත් කළ යුතුය. පිටකවරය, පිළිගැන්වීම, හැඳින්වීම, පෙරවදන, පසු වදන ඇතුළු සියලු කොටස් ගිවිසුම් අත්සන් කළ පසු ඉදිරිපත් කළ යුතුය.

(ඈ) අත්පිටපත විධිමත්ව හා මනාව බැඳ තිබිය යුතුය.

(ඉ) අත්පිටපතේ කර්තෘගේ නම හෝ කර්තෘ හඳුනා ගත හැකි වෙනත් සලකුණක් අන්තර්ගත නොවිය යුතුය.

(ඊ) නිවැරදිව පිටු අංක යොදා තිබිය යුතුය.

(උ) අත්පිටපත ඉදිරිපත් කිරීමට පෙර එහි භාෂාව මැනවින් සකස් කොට ඉදිරිපත් කළ යුතුය.

## 6. අයදුම් කිරීම් හා අත්පිටපත් ඉදිරිපත් කිරීම

(අ) ළමා සහ යොවුන් සාහිත්‍ය අත්පිටපත්වලට පමණක් මෙම ව්‍යාපෘතිය යටතේ ආධාර ලබා දෙනු ලැබේ. ඒ සඳහා යෝග්‍ය/අයෝග්‍යතාව සලකා බැලීම සඳහා අයදුම්පත නිසි පරිදි පුරවා, කෘතියේ පිටපත් දෙකක්, සමීක්ෂණ ගාස්තු ද සමග ඉදිරිපත් කළ යුතුය.

(ආ) අයදුම්පත් ගාස්තුව රු.150.00 වේ.

(ඇ) පරිවර්තිත කෘතියක් පළ කිරීමේ දී මතුවන නීතිමය ගැටලු ඇතොත් ඒවා විසඳා ගැනීම කතුවරයාගේ/පරිවර්තකගේ වගකීම වේ. (අදාළ අවසර ගැනීම ලිඛිතව ඉදිරිපත් කළ යුතුය)

(ඈ) වර්ෂයකට එක් අයකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අත්පිටපතකි.

(උ) මණ්ඩලයීය ප්‍රකාශන ආධාර ව්‍යාපෘති යටතේ මීට පෙර අවස්ථා තුනක දී (03) මුද්‍රණ අනුග්‍රහය ලබා ඇති ලේඛකයන්ගේ අත්පිටපත් භාර නොගැනේ.

## 7. මූලික සමීක්ෂණය

අදාළ අත්පිටපත් පිළිබඳ මූලික පරීක්ෂණය මණ්ඩලයේ ප්‍රකාශන උපදේශක කමිටුව විසින් සිදුකරනු ලබන අතර එහිදී ව්‍යාපාතියට ඇතුළත් කර ගැනීම ට මූලික අනුමැතිය ලද අත්පිටපත් පමණක් සමීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. ප්‍රකාශන උපදේශක කමිටුව විසින් මූලික පරීක්ෂණයේ දී ප්‍රතික්ෂේප කරනු ලබන අත්පිටපත් අදාළ සමීක්ෂණ ගාස්තු ද සමග ලේඛකයා වෙත ආපසු යොමු කරනු ලැබේ.

## 8. සමීක්ෂණ ගාස්තු

(අ) ළමා අත්පිටපත් සඳහා

| | |
|---|---|
| පිටු 1-16 දක්වා | රු. 500. 00 |
| පිටු 16ට වැඩි සෑම පිටුවක් සඳහාම | රු. 5.00 බැගින් |

(ආ) යොවුන් සාහිත්‍ය අත්පිටපත් සඳහා

| | |
|---|---|
| පිටු 150 දක්වා | රු.1000.00 |
| පිටු 150 ට වැඩි සෑම පිටුවක් සඳහාම | රු. 6.00 බැගින් |

මෙම අත්පිටපතක් සමීක්ෂකයින් දෙදෙනෙක් හෝ විශේෂ අවස්ථාවක තිදෙනෙක් වෙත යොමුකෙරෙන බැවින් මෙම ගාස්තුවලින් ආවරණය වෙන්නේ සමීක්ෂණ වියදම් වලින් කොටසක් පමණි. ඉතිරි ප්‍රමාණය මණ්ඩලය විසින් දරනු ලැබේ.

සමීක්ෂණ ගාස්තුවලට අදාළ චෙක්පත්, **සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය** යන නමට ලිවිය යුතුය. මුදලින් ගෙවතොත්, කාර්යාල දිනයන්හි **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා එම ගෙවීම්, මණ්ඩලයේ සරප් වෙත ගෙවා ලදුපතක් ලබා ගත යුතුය. එසේ නොමැති නම් දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් **මහජන බැංකුව, කොළඹ පුරහල ශාඛාවේ අංක 167-1-001-6-3170315** දරන **ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ගිණුමට** බැර කරන සේ මුදල් තැන්පත් කර ලබා ගත් පිළිපත අත්පිටපත සමග ඉදිරිපත් කළ යුතුය.

## 09. රහස්‍යභාවය

අත්පිටපත් සමීක්ෂණයේ දී සමීක්ෂකවරයාට කර්තෘ පිළිබඳ හෝ කර්තෘට සමීක්ෂකවරයා පිළිබඳ කිසිදු තොරතුරක් අනාවරණය කරනු නොලැබේ. මෙම රහස්‍යභාවයට බාධා කිරීම හෝ බාධා කිරීමට තැත් කිරීම අත්පිටපත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ.

## 10. සමීක්ෂණය

සමීක්ෂණය සඳහා සුදුසුකම් ලත් සෑම අත්පිටපතක්ම සාමාන්‍යයෙන් සමීක්ෂකයන් දෙදෙනෙකු වෙත යොමු කරනු ලැබේ. මෙම සමීක්ෂණ මණ්ඩලය අදාළ විෂය පිළිබඳ විශේෂඥතාවක් ඇති අයගෙන් සමන්විත වේ. සමීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා, ප්‍රකාශන උපදේශක කමිටුව විසින් සලකා බැලීමෙන් අනතුරුව, අදාළ අත්පිටපත පිළිගැනීම හෝ නොපිළිගැනීම පිළිබඳ තීරණය කරනු ලැබේ. සංශෝධනය කිරීමෙන් පසු නැවත සලකා බැලිය යුතු යැයි කමිටුව තීරණය කරනු ලබන අත්පිටපත්වල තත්ත්වය උසස් කිරීමට ඉටු කළ යුතු සංශෝධන සමීක්ෂණ වාර්තාවේ දක්වා ඇත්නම්, එම කොටස් උපුටා කර්තෘවරයාට දැනුම් දෙනු ලැබේ. සමීක්ෂණ වාර්තාවල සම්පූර්ණ අයිතිය මණ්ඩලය සතු වන අතර, කවර ම හේතුවක් නිසා හෝ ඒවා ලේඛකයා වෙත නිකුත් කරනු නොලැබේ.

## 11. ප්‍රතික්ෂේප වූ අත්පිටපත්

ආධාර ලැබීම සඳහා අත්පිටපත් අනුමත කිරීම හෝ නොකිරීම පිළිබඳ ප්‍රකාශන උපදේශක කමිටුවේ තීරණය අවසන් තීරණය වේ. ප්‍රතික්ෂේප වූ අත්පිටපත් ලේඛකයා වෙත ආපසු එවනු ලැබේ. එම අත්පිටපත් සමීක්ෂණය සඳහා මණ්ඩලය විසින් දරන ලද අමතර සමීක්ෂණ ගාස්තු කතුවරයාගෙන් අය කරනු නොලැබේ.

## 12. මුද්‍රණයේදී සපුරාලිය යුතු අවශ්‍යතා

ග්‍රන්ථ ප්‍රකාශන ව්‍යාපෘතිය යටතේ අනුමත කරනු ලබන අත්පිටපත් මුද්‍රණය කිරීමේදී අනුගමනය කළ යුතු ප්‍රමිති ගිවිසුම් පත්‍රයෙහි ඇතුළත් වන අතර, එම ප්‍රමිති අනුගමනය කිරීම කර්තෘවරයාගේ වගකීම වේ.

(අ) ළමා කෘති අවම වශයෙන් ජී.එස්.එම්. 80 කඩදාසියේ මුද්‍රණය කළ යුතු අතර, යොවුන් සාහිත්‍ය කෘති අවම වශයෙන් ජී.එස්.එම්. 70 නො. 01 (70 GSM No.01) කඩදාසියේ මුද්‍රණය කළ යුතු වේ.

(ආ) ළමා කෘති සඳහා අවම වශයෙන් 16 හා යොවුන් සාහිත්‍ය කෘති සඳහා 12 ප්‍රමාණයේ අකුරු භාවිත කළ යුතුය. (ගිවිසුමට අනුව කටයුතු කළ යුතුය)

(ඇ) ළමා කෘති සඳහා නූල් බැම්ම වඩාත් සුදුසු වන අතර, කම්බි බැම්ම ද භාවිත කළ හැකිය. යොවුන් සාහිත්‍ය කෘති සඳහා පර්ෆෙක්ට් (Perfect Binding) හෝ සෙක්ෂන් (Section Binding) ක්‍රමයට ද බැඳ තිබිය යුතුය.

(ඈ) ග්‍රන්ථ නාම පිටුව සැකසීම හා ග්‍රන්ථයේ සැලැස්ම පිළිබඳ සම්මත ග්‍රන්ථ විද්‍යාත්මක ක්‍රම පිළිපැදිය යුතුය. ( ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ප්‍රකාශිත අදාළ උපදෙස් සහිත"ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය" හා ළමා ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය නමැති ග්‍රන්ථ, ජාතික පුස්තකාල පොත්හලෙන් මිලට ගැනීමට හෝ ජාතික පුස්තකාලයේ පාඨක සේවා අංශයෙන් විමර්ශනය කිරීමට පහසුකම් සලසා ඇත.) මෙය www.natlib.lk වෙබ් පිටුව හරහා පරිශීලනය කිරීමේ හැකියාව ඇත.

(ඉ) අවම වශයෙන් 230 GSM ආර්ට් බෝඩ්වලින් පිටකවර සකස් කළ යුතු අතර, පිටකවරය වර්ණ 04 (Four Colours) කින් යුක්ත විය යුතුය. ළමා කෘතිවල ඇතුළත චිත්‍ර ද වර්ණ හතර (04) කින් යුක්ත විය යුතුය.

(ඊ) මුද්‍රණ දෝෂ විරහිත විය යුතුය.

(උ) මුද්‍රණයට පෙර ග්‍රන්ථයේ පිටකවරය, ග්‍රන්ථ නාම පිටුව හා එහි පසු පිටුව මණ්ඩලයට පෙන්වා අනුමත කරවා ගත යුතු වේ.

(ඌ) ග්‍රන්ථය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි මුද්‍රණාලයකින් මුද්‍රණය කොට එම මුද්‍රණාලයේ ලියාපදිංචි අංකය සමඟ අදාළ ග්‍රන්ථයේ පිටපත් 1000ක් මුද්‍රණය කළ බවට මුද්‍රණ ආයතනය මගින් ලිඛිතව තහවුරු කළ යුතුය.

## 14. ගිවිසුම හා ප්‍රකාශනය

i. ව්‍යාපෘතිය යටතේ අනුමත වූ අත්පිටපත් ප්‍රකාශනයට පෙර ලේඛකයා මණ්ඩලය සමඟ ගිවිසුමකට එළැඹිය යුතුය.

ii. එම ගිවිසුමෙන් මණ්ඩලය විසින් අනුමත කරන ලද අත්පිටපත නියමිත කොන්දේසිවලට අනුව මුද්‍රණය කරවා නියමිත දිනට පෙර අදාළ මුද්‍රිත පිටපත් මණ්ඩලය වෙත ගෙනවිත් භාරදෙන බවට ලේඛකයා ගිවිස ගත යුතුය.

iii. අදාළ කොන්දේසි අනුව මුද්‍රණය කරන ලද පොත්වලින් පිටපත් සංඛ්‍යාවක් මුද්‍රණ කමිටුව විසින් තීරණය කරනු ලබන මිලට ලබා ගන්නා බවට මෙහිදී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය එකඟ වේ.

iv. අනුමත වූ අත්පිටපත් ප්‍රකාශනය කිරීමේදී මණ්ඩලයෙන් ලිඛිත අවසරයක් නොමැතිව අදාළ අත්පිටපතට කිසිදු කොටසක් ඇතුළත් කිරීම හෝ අත්පිටපතෙන් කිසිදු කොටසක් ඉවත් කිරීම හෝ නොකළ යුතුය.

v. ගිවිසුමේ කොන්දේසි කුමන ආකාරයකින් හෝ කඩකිරීම ගිවිසුම අවලංගු කිරීමට හේතු වේ.

vi. මුද්‍රණ කටයුතු අවසන්වීමෙන් පසු ආදර්ශ මුද්‍රිත පිටපත් දෙකක් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර, එහිදී අදාළ කොන්දේසිවලට අනුකූලව මුද්‍රණය කර ඇත්දැයි පරීක්ෂා කරනු ලැබේ. එම ආදර්ශ මුද්‍රිත පිටපත අනුමත වීමෙන් පසු මණ්ඩලයට ලැබිය යුතු මුද්‍රිත පිටපත් භාරදිය යුතුය. මණ්ඩලයට සපයනු ලබන සියලුම මුද්‍රිත පිටපත් මණ්ඩලය වෙත කලින් ඉදිරිපත් කරන ලද ආදර්ශ මුද්‍රිත පිටපතට සෑම අතින්ම අනුකූල විය යුතුය.

vii. **ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය හරහා අනුමත වී ප්‍රකාශයට පත් කරන ලද කෘතිවල මුද්‍රිත පිටපත සමග එහි මෘදු පිටපත (Soft copy) මණ්ඩලය වෙත ලබා දීම අනිවාර්ය වේ.**

**සැ.යු : ඉහත සඳහන් කොන්දේසි සපුරා නොමැති, විශේෂයෙන් මුද්‍රණ දෝෂ සහිත කෘති, ප්‍රකාශන උපදේශක කමිටුවේ නිර්දේශය මත ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය මණ්ඩලය සතු වේ.**

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත
කොළඹ 07
විමසීම : 011-2687583

# E - Publishing

ආධුනික හා ප්‍රවීණ ලේඛකයන්ගේ ලේඛන අභිවෘද්ධිය නගාසිටුවීමේ අරමුණින් මෙහෙයවන ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය තවදුරටත් පුළුල් කරමින් e – publishing ව්‍යාපෘතිය ආරම්භ කර තිබේ. ලෝකය පුරා e Book publishing වෙත නැඹුරු වෙමින් පවතින යුගයක ජාතියට කියවීම හුරුකරවීමේ පුරෝගාමියා ලෙස ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මගින් ජාතික ඊ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබයි.

ලෝකය පුරා මෙම e Book publishing ජනප්‍රිය වීමට මූලිකම හේතුව වී ඇත්තේ ඒ මගින් පොතපත වෙත ප්‍රවේශ වීමට ඇති පහසුවයි. එසේම තැන්පත් කරගෙන එහා මෙහා ගෙන යා හැකිය. අවශ්‍ය ඕනෑම අවස්ථාවක ඉතාම පහසුවෙන් පාඨකයා රුචි ආකාරයට පොත් පරිශීලනය කිරීමට මේ හරහා ඔහුට හැකියාව ලැබේ.

**e Book භාවිතයේ වාසි**

- සංචිතය තුළ එකවර පොත්පත් විශාල ප්‍රමාණයක් ගබඩා කළ හැකිය.
- මෙම ව්‍යාපෘතිය හරහා ලේඛකයකුට පොත් ප්‍රකාශයට පත් කිරීමේදී අවම වියදමකින් සිය කෘතිය ප්‍රකාශයට පත් කරගැනීමට හැකියාව ලැබේ.
- ඉතා අඩු කාලයකින් මෙන්ම පහසුවෙන් සිය ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරගැනීමට ලේඛකයාට හැකි වීම.
- e පිටපතේ මිල තීරණය කිරීමට ලේඛකයාට හැකිවීම.
- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය එක්ව ක්‍රියාත්මක කෙරෙන **kiyawamu.lk** වෙබ් අඩවිය හරහා මෙම කෘතිය පාඨකයා වෙත සමීප කරවීමට හැකිවීම. ඒ ඔස්සේ සිය කෘතිය බාගත කරන සෑම අවස්ථාවකදීම 35%ක කර්තෘ භාගයක් හිමිවීම.
- සෑම කෘතියකටම ආරක්ෂාව හා නීතිමය රැකවරණය මෙන්ම ප්‍රචාරණයක් ලබා ගැනීමට හැකිවීම
- ජාතික කියවීමේ මාසයේදී වසරේ හොඳම **e book** ස්වර්ණ සම්මානය සඳහා නිර්දේශිත කෘති සංචිතයට ඇතුළත් වීමට අවස්ථාව සැලසීම.
- හොඳම **e කෘතිය** සඳහා සම්මාන පිරිනැමීම**.**
- පාඨකයාට පහසුවෙන් පරිහරණය කළ හැකිවීම.
- දේශ සීමාමායිම්වලින් තොරව ලොව ඕනෑම පාඨකයකු වෙත ප්‍රවේශ වීමට ඇති හැකියාව.

## ePublishing ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් කළ හැකි කෘති

පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ මෙම ව්‍යාපෘතිය සඳහා අත්පිටපත් ඉදිරිපත් කළ හැකිය.

- ශාස්ත්‍රීය / පර්යේෂණ කෘති
- විෂයානුබද්ධ / පරිවර්තන කෘති
- නිර්මාණාත්මක කෘති (නවකතා / කෙටිකතා / පද්‍ය / නාට්‍ය / ගීත)
- ළමා සාහිත්‍ය කෘති
- යොවුන් සාහිත්‍ය කෘති

ශාස්ත්‍රීය හෝ සාහිත්‍යමය වටිනාකමකින් යුත් අත්පිටපත්වලට පමණක් මෙම ව්‍යාපෘතිය යටතේ ආධාර දෙනු ලැබේ. ඒ සඳහා යෝග්‍ය /අයෝග්‍යතාව සලකා බැලීම පිණිස අදාළ අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර**,** කෘතියේ පිටපත් දෙකක්**, CD** තැටිය හා සමීක්ෂණ ගාස්තුවද සමග ඉදිරිපත් කළ යුතු වේ. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය මගින් ලබා ගත හැකිය.